# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2015

2021 මාර්තු - ජූනි

සමාජීයවිද්‍යා පීඨය

## ආර්ථික විද්‍යාව

### සූක්ෂම ආර්ථික විද්‍යාව

## ECON – E 2015

ඕනෑම ප්‍රශ්න (04) කට පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

① I ආන්තික උපයෝගිතා න්‍යාය විස්තර කරන්න. (ලකුණු 5)

II ආන්තික උපයෝගිතා න්‍යායේ භාවිතා කරන උපකල්පන විස්තර කර ඒවායේ අදාලත්වය පැහැදිලි කරන්න. (ලකුණු 10)

III ආන්තික උපයෝගිතා න්‍යායේ දුර්වලතා සාකච්ඡා කරන්න. (ලකුණු 5)

② I උපේක්ෂා වක්‍ර අර්ථ දක්වා , ඒවා ගොඩනගා ගන්නා ආකාරය ප්‍රස්ථාර භාවිතයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 5)

II උපේක්ෂා වක්‍ර විශ්ලේෂණයේ භාවිතාවන උපකල්පන විස්තර කරන්න. (ලකුණු 5)

III උපේක්ෂා වක්‍රවල ගති ලක්ෂණ මොනවාද ? (ලකුණු 5)

IV ආන්තික ආදේශන අනුපාතය පැහැදිලි කරන්න. (ලකුණු 5)

③ I මිල වෙනස්වීමේ ආදායම් ප්‍රතිවිපාකය සහ ආදේශන ප්‍රතිවිපාකය අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 10)

II යෝග්‍ය ක්‍රමයක් භාවිතයෙන් මිල අඩුවීමක ආදේශන සහ ආදායම් ප්‍රතිවිපාක වෙන්කර දක්වන්න. (ලකුණු 10)

④ I නිෂ්පාදන ශ්‍රිතය අර්ථ දක්වා, කෙටි කාලයේදී නිෂ්පාදන තීරණ ගන්නා ප්‍රශස්ථ නිෂ්පාදන අවධිය පැහැදිලි කරන්න. (ලකුණු 10)

II සම නිෂ්පාදන වක්‍ර හඳුන්වා ඒවායේ ගති ලක්ෂණ පැහැදිලි කරන්න. (ලකුණු 10)

⑤ I ඒකාධිකාරී වෙළෙඳපොළ ආකෘතිය හඳුන්වන්න. (ලකුණු 5)

II ඒකාධිකාරී වෙළෙඳපොළක කෙටි කාලීන සමතුලිතය ප්‍රස්ථාර භාවිතයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 5)

III මිල විශේෂණය යනු කුමක්දැයි හඳුන්වා, මිල විශේෂණයේ ප්‍රතිවිපාක සාකච්ඡා කරන්න. (ලකුණු 10)

⑥ සාධක මිල පිළිබඳ ආන්තික ඵලදායිතා න්‍යාය පැහැදිලි කර භාණ්ඩ හා සාධක වෙළෙඳපොළ පූර්ණ තරඟකාරී තත්ත්වය යටතේ වැටුප තීරණය වන ආකාරය එම න්‍යාය ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 20)

⑦ I කෙටි කාලීන සහ දිගු කාලීන සාමාන්‍ය පිරිවැය වක්‍රවල හැසිරීම පිළිබඳ සාකච්ඡා කරන්න. (ලකුණු 10)

II සුදුසු සටහන් භාවිතා කරමින් ආයතනයක සාමාන්‍ය පිරිවැය සහ ආන්තික පිරිවැය අතර පවතින සම්බන්ධතාවය විස්තර කරන්න. (ලකුණු 10)

⑧ කෙටි සටහන් ලියන්න.

I ප්‍රත්‍යක්ෂ වරණ න්‍යාය
II ආදායම් පරිභෝජන වක්‍රය සහ මිල පරිභෝජන වක්‍රය
III ආර්ථික බද්ධකුලිය
IV කතිපයාධිකාරී වෙළෙඳපල

**************************************************